ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

# ලංසු කැඳවීම
# ලංකා විදුලිබල මණ්ඩලය

ලංසු අංකය: LV / S / Fly Ash /004

## නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ 01, 02 සහ 03 ඒකකයෙන් නිෂ්පාදනය කරන ලද පියාසර අළු (Fly Ash) විකිණීම
### 2024 අගෝස්තු සිට 2027 ජූලි දක්වා

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) වෙනුවෙන් අමාත්‍යය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලයේ (SCAPC) සභාපතිවරයා විසින් නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ ඒකක 01, 02 සහ 03 මගින් නිපදවනු ලබන පියාසර අළු (Fly Ash) විකිණීම සඳහා මුද්‍රා තැබූ ලංසු 06/03/2024 පෙ.ව 10.00 දක්වා කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ලංවිමෙන් මිලදී ගන්නා ලියකියවිලි මත පමණි.

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ (LVPP) ඉංජිනේරු (වාණිජ) කාර්යාලයේදී සහ ලංවිම වෙබ් අඩවියෙන් (www.ceb.lk/tender ) ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කළ හැක.

මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරුවන්ට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු බලස්ථාන කළමනාකරු (LVPP), ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චෝලේ යන ලිපිනයට ආපසු නොගෙවන ගාස්තුවක් ලෙස එක් ටෙන්ඩර් පොතක් සඳහා රුපියල් 200,000/- බැගින් ගෙවා මිලදී ගත හැක. 05/03/2024 දක්වා ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව 09.00 ත් ප.ව 03.00 ත් අතර මහජන බැංකුවේ ගිණුම් අංක 204200140085134 සාමාන්‍යාධිකාරී ලංවිම නමින් ලියන ලද බැංකු කෙටුම්පතක් හෝ තැන්පතු පත්‍රිකාවක් මඟින් ගෙවීම් කර ටෙන්ඩර් පොත ලබා ගත හැක.

ලියාපදිංචි තැපැලෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු - ජනක අංශය), 2 වන මහල ජනන මූලස්ථානය, ලංකා විදුලිබල මණ්ඩලය, නව කැලණි පාලම පාර, කොළොන්නාව, 10600 යන ලිපිනයට තැපැල් කර එවීම හෝ මෙම ලිපිනයෙහි මේ සඳහා ලබා දී ඇති ලන්සු පෙට්ටියට ගෙනවිත් භාරදීම, 06/03/2024 දින පෙ:ව: 10.00 හෝ ඊට පෙර සිදු කල යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු කැඳවීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් අය ඉදිරියේ ලංසු විවෘත කිරීම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු - ජනන අංශය), 2 වන මහල ජනන මූලස්ථානය, ලංකා විදුලිබල මණ්ඩලය, නව කලණි පාලම පාර, කොලොන්නාව යන කාර්යාලයේදී සිදුකෙරේ. ලංසු ආරක්ෂාවෙහි (Bid Security) වටිනාකම ඉදිරියට එන මිල ගැලපීම් සැලකිල්ලට නොගෙන වසර තුනක මුළු කාලය තුළ මිලදී ගැනීමට අපේක්ෂිත මුළු ප්‍රමාණයන්ගෙන් 1% ක වටිනාකමට සමාන විය යුතුය. (උපග්‍රන්ථය V-A, උපග්‍රන්ථය V-B, සහ උපග්‍රන්ථය V-C හි සඳහන් වාර්ෂික ප්‍රමාණයෙන් 3 ගුණයක්). ලංසු සුරැකීම ලංසු අවසන් කළ දින සිට දින එකසිය පනහ (150) (03/08/2024) දක්වා) සඳහා වලංගු විය යුතුය. ලංසු කැඳවීම අවසන් වන දිනට සති දෙකකට පෙර සියලුම පැහැදිලි කිරීම් බලස්ථාන කළමනාකරු (LVPP), ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චෝලේ යන ලිපිනයෙන් ඉල්ලා සිටිය යුතුය.

තොරතුරු පිටපත සඳහා සබැඳිය – ( CLICK HERE ).

සියළු විමසීම්- දුරකථන: 0322268964/0322268965

**බලස්ථාන කළමනාකරු (ලක්විජය බලාගාරය),**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**නාරක්කල්ලිය, නොරොච්චෝලේ.**